www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | 2 ඒකකය |
|---|---|---|

## බලය විමධ්‍යගත කිරීම හා බෙදා හැරීම

### I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පරමාධිපත්‍ය බලයට අයත් නොවන්නේ මින් කුමක්ද?
    (1). ආර්ථික බලය  (3). ඡන්ද බලය
    (2). පාලන බලතල  (4). මූලික අයිතිවාසිකම්

02. 1978 ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ක්‍රියාත්මක කළ යුත්තේ ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන,
    (1). අගමැතිවරයාය  (3). මන්ත්‍රීවරුන්ය
    (2). ජනාධිපතිවරයාය  (4). ආණ්ඩුකාරවරයාය

03. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ඒකක වෙත පවරා දීම.
    (1). බලය විමධ්‍යගත කිරීමයි  (3). අධිකාරී බලයයි
    (2). බලය බෙදා හැරීමයි  (4). ඡන්ද බලයයි

04. බලය විමධ්‍යගත කර ඇති ඒකීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන්නේ කුමන ආණ්ඩුද?
    (1). සන්ධීය ආණ්ඩු  (2). ෆෙඩරල් ආණ්ඩු  (3). ඒකීය ආණ්ඩු  (4). ප්‍රාන්ත ආණ්ඩු

05. ඒකීය ආණ්ඩු ක්‍රම පවතින රාජ්‍යයන්ට නිදසුනක් නොවන්නේ,
    (1). ඇමරිකා එක්සත් ජනපදය  (3). මහා බ්‍රිතාන්‍යය
    (2). ශ්‍රී ලංකාව  (4). ප්‍රංශය

06. සන්ධීය ආණ්ඩු ක්‍රම පවතින රටක් වන්නේ,
    (1). මහා බ්‍රිතාන්‍යය  (2). ස්විට්සර්ලන්තය  (3). නෙදර්ලන්තය  (4). සිංගප්පූරුව

07. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටු වීම සිදු වූයේ,
    (1). 1926 බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම නිසාය.
    (2). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මතය.
    (3). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 පාර්ලිමේන්තු පනත මගිනි.
    (4). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුවය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

Agaram.LK - Keep your dreams alive!

08. පළාත් සභාවක නිල කාලය වන්නේ,

(1). වසර 6 කි (2). වසර 5 කි (3). වසර 2 කි (4). වසර 4 කි

09. අප රටේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනයක් නොවන්නේ,

(1). මහ නගර සභා (2). ප්‍රාදේශීය සභා (3). ගම් සභා (4). නගර සභා

10. වර්තමානයේ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත,

(1). 50 කි (2). 60 කි (3). 13 කි (4). ප්‍රාන්ත 26 කි

- **පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11. රාජ්‍යයක පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා එම රාජ්‍යයට ඇති හැකියාව බලයයි. ( )
12. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම බලය මධ්‍යගත කිරීම නම් වේ. ( )
13. ඒකීය රාජ්‍යයක් තුළ මධ්‍යම හා ප්‍රාන්ත වශයෙන් බල මධ්‍යස්ථාන වර්ග 2ක් දැකිය හැක. ( )
14. සන්ධීය රාජ්‍ය ෆෙඩරල් රාජ්‍ය ලෙසින් ද හැඳින්වේ. ( )
15. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය වන කොංග්‍රස් මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් පමණක් සමන්විත වේ. ( )

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16. බලයේ අවසාන හිමිකරුවා ....................................................... වන අතර මහජනතාව සතු එම බලය ....................................................... ලෙස හැඳින්වේ.
17. රාජ්‍ය සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන බලතල එක් මධ්‍යම ආණ්ඩුවක් තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය ....................................................... වේ.
18. ....................................................... මූලිකම ලක්ෂණයක් වන්නේ රාජ්‍යයේ බලය මධ්‍යම ආණ්ඩුව හා ....................................................... අතර බෙදී තිබීමයි.
19. ස්විට්සර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු ....................................................... ලෙස හැඳින්වේ.
20. පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම ....................................................... සතු බලතල හා කාර්යයක් වේ.

**(සන්ධීය රාජ්‍ය / ආණ්ඩුකාරවරයා / ඒකීය රාජ්‍ය / මහජනතාව / පරමාධිපත්‍ය / ප්‍රාන්ත / කැන්ටන්)**

(20 × 02 = 40)

agaram.lk



agaram.lk

## II කොටස

- **ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (1). බලය විමධ්‍යගතකරණයේ දී දැකිය හැකි විශේෂ ලක්ෂණය කුමක්ද? (ල.02)
(2). බලයේ විවිධ ස්වරූප 4 නම් කරන්න. (ල.04)
(3). මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කළ හැකි ස්වරූප 3 උදාහරණ සමඟ දක්වන්න. (ල.06)

02. (1). ඒකීය රාජ්‍ය යනු කුමක්දැයි මහාචාර්ය හර්මන් ජේ. ෆයිනර්ට නමැති දේශපාලන විද්‍යාඥයාට අනුව නිර්වචනය කරන්න. (ල.03)
(2). ඒකීය රාජ්‍යයක ලක්ෂණ මොනවාද? (ල.04)
(3). නූතන රාජ්‍යයන්, බලය බෙදා හැරීමට හේතු මොනවාද? (ල.03)
(4). සන්ධීය රාජ්‍යයක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග මොනවාද? (ල.02)

03. (1). සන්ධීය ආණ්ඩු හා ඒකීය ආණ්ඩු අතර වෙනස්කම් දක්වන්න. (ල.04)
(2). සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ 4 ක් දක්වන්න. (ල.04)
(3). ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන අංශ 3 නම් කර එම ආයතන වලින් ඉටුවන කාර්යය දක්වන්න. (ල.04)

04. (1). ශ්‍රී ලංකාවේ අනුරාධපුර පොළොන්නරු යුගයන් හි බලය විමධ්‍යගත කිරීමට උදාහරණ දක්වන්න. (ල.03)
(2). බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කරන ලද්දේ කුමන ආකාරයෙන්ද? (ල.05)
(3). නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා ගත් උත්සාහයන් මොනවාද? (ල.04)

05. (1). ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සිදු වූයේ කුමන පනතක් මගින්ද? (ල.03)
(2). ශ්‍රී ලංකාවේ පළාත් නමය නම් කරන්න. (ල.05)
(3). ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආයතනික ව්‍යුහය දක්වන්න. (ල.04)

06. (1). පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් මොනවාද? (ල.06)
(2). පළාත් මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් 3 ක් දක්වන්න. (ල.03)
(3). පළාත් සභා සතු බලතල හා කාර්යය දක්වෙන ලැයිස්තු 3 නම් කරන්න. (ල.03)

07. (1). ඇමරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහි වූ අයුරු දක්වන්න. (ල.04)
(2). ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය පිළිබඳ කරුණු 4 ක් දක්වන්න. (ල.04)
(3). ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩු සතු බලතල හා ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල වගුගත කරන්න. (ල.04)

08. (1). ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට බලපෑ හේතු 3 ක් දක්වන්න. (ල.03)
(2). ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩු සතු බලතල හා කැන්ටන් සතු බලතල වෙන් කර දක්වන්න. (ල.06)
(3). ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ 3 ක් දක්වන්න. (ල.03)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!